# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,538 - 2008 පෙබරවාරි මස 22 වැනි සිකුරාදා - 2008.02.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 195 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 194 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 198 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*- ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 දෙසැම්බර් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* **II** වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

ශ්‍රී ධම්මාලංකාර සමාජසේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 නොවැම්බර් 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* **II** වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

බණ්ඩාරගම වික්‍රමශීලා ධර්මායතන සමාජසේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2007.11.30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* **II** වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 පෙබරවාරි මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 පෙබරවාරි මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - කන්තලේ

### හිමිකම් නොකියන ලද හා රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කන්තලේ මහෙස්ත්‍රාත් අධිකරණයේ මෙතෙක් හිමිකම් නොකියන ලද හා රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ 2008 ක් වූ මාර්තු මස 15 වැනි දින පෙරවරු 9.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය පවත්වන දින පැය භාගයකට කලින් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

භාණ්ඩ වෙන්දේසි කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

සියළුම භාණ්ඩ මුදල් ගෙවා එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

හැඳුනුම්පත් රැගෙන ඒම අනිවාර්ය වේ.

මෙම උපලේඛනයේ සඳහන් භාණ්ඩ හෝ කිසියම් භාණ්ඩයක හිමිකම් පාන්නකු ඇත්නම්, වෙන්දේසියට නියමිත දිනට පෙර තම හිමිකම් ඉදිරිපත් කළ යුතුය. පසුව කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

ඒ. එම්. ඩී. එස්. දික්කාපිටිය,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසාවිනිසුරු,
කන්තලේ.

2008 පෙබරවාරි මස 05 වැනි දින,
කන්තලේ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | ඒආර් 275/07 | අංක 4034377 පාපැදිය | 01 |
| 02. | එම්සී 30450 | අංක 9954 ආර්එම් පාපැදිය | 01 |
| 03. | ඒආර් 314/07 | කෙයින්ටාර් පාපැදි | 01 |
| 04. | ඒආර් 273/07 | සීසී 19038 සී පාපැදිය | 01 |
| 05. | ඒආර් 274/07 | බී 42235 පාපැදිය | 01 |
| 06. | ඒආර් 276/07 | අංක 8980395 පාපැදිය | 01 |
| 07. | ඒආර් 272/07 | අංක 03 සී 9277 පාපැදිය | 01 |
| 08. | එම්සී 30363 | අංක ටීඑන් 30515 පාපැදිය | 01 |
| 09. | එම්සී 30679 | අංක 64027 පාපැදිය | 01 |
| 10. | එම්සී 30678 | අංක 56001643 පාපැදිය | 01 |
| 11. | ඒආර් 522/07 | අංක පීසීඅයි - 31882 පාපැදිය | 01 |
| 12. | ඒආර් 522/07 | අංක 79 ඒ 52720 පාපැදිය | 01 |
| 13. | ඒආර් 522/07 | අංක 55507350 පාපැදිය | 01 |
| 14. | එම්සී 30506 | අංක 4 ඩී 12507 පාපැදිය | 01 |
| 15. | එම්සී 30507 | පාපැදිය | 01 |
| 16. | එම්සී 30451 | අංක සීසී 1180914 පාපැදිය | 01 |
| 17. | ඒආර් 95/07 | අංක 702950 පාපැදිය | 01 |
| 18. | එම්සී 29246 | පාපැදිය | 01 |
| 19. | එම්සී 29498 | අංක 01113552 පාපැදිය | 01 |
| 20. | එම්සී 29498 | අංක 55503819 පාපැදිය | 01 |
| 21. | එම්සී 30366 | අංක 55923686 පාපැදිය | 01 |
| 22. | ඒආර් 277/07 | අංක පී 170722 පාපැදිය | 01 |
| 23. | එම්සී 30508 | අංක 56සී 30863 පාපැදිය | 01 |
| 24. | - | කරත්ත (කැඩී ගිය) | 01 |
| 25. | - | කරත්ත (කැඩී ගිය) | 01 |
| 26. | - | කරත්ත (කැඩී ගිය) | 01 |
| 27. | - | කරත්ත (කැඩී ගිය) | 01 |
| 28. | - | කරත්ත (කැඩී ගිය) | 01 |
| 29. | - | කරත්ත (කැඩී ගිය) | 01 |
| 30. | - | කරත්ත (කැඩී ගිය) | 01 |
| 31. | - | කරත්ත (කැඩී ගිය) | 01 |
| 32. | - | කරත්ත (කැඩී ගිය) | 01 |
| 33. | - | කරත්ත (කැඩී ගිය) | 01 |
| 34. | - | කරත්ත (කැඩී ගිය) | 01 |
| 35. | - | කරත්ත රෝද | 01 |
| 36. | - | කරත්ත රෝද | 02 |
| 37. | - | කරත්ත රෝද | 02 |
| 38. | - | කරත්ත රෝද | 02 |
| 39. | - | කරත්ත රෝද | 02 |
| 40. | - | කරත්ත රෝද | 02 |
| 41. | - | කරත්ත රෝද | 02 |
| 42. | - | කරත්ත රෝද | 02 |
| 43. | - | කරත්ත රෝද | 02 |
| 44. | - | කරත්ත රෝද | 02 |
| 45. | - | කරත්ත රෝද | 02 |
| 46. | - | කරත්ත රෝද | 02 |
| 47. | - | කරත්ත රෝද | 02 |
| 48. | එම්සී 29541 | අංක 8919 මෝටරය සහිත හා 1650 බහුකාර්ය වඩු වැඩ යන්ත්‍රය | 01 |
| 49. | එම්සී29216 | එම්කිව් 442 බී 00669 සහ අංක 0640 වඩුවැඩ යන්ත්‍රය | 01 |
| 50. | එම්සී 29542 | කියත් | 01 |
| 51. | එම්සි 2376/05 | කියත් | 01 |
| 52. | එම්සී 28187 | කියත් | 01 |
| 53. | එම්සී 31054 | පොරොවා | 01 |
| 54. | එම්සී 31045 | පොරොවා | 01 |
| 55. | එම්සී 31044 | පොරොවා | 01 |
| 56. | එම්සී 31043 | පොරොවා | 01 |
| 57. | එම්සී 31042 | පොරොවා | 01 |
| 58. | එම්සී 31041 | පොරොවා | 01 |
| 59. | එම්සී 31040 | පොරොවා | 01 |
| 60. | එම්සී 31039 | පොරොවා | 01 |
| 61. | එම්සී 31034 | පොරොවා | 01 |
| 62. | එම්සී 31046 | පොරොවා | 01 |
| 63. | එම්සී 31058 | පොරොවා | 01 |
| 64. | එම්සී 31059 | පොරොවා | 01 |
| 65. | එම්සී 31060 | පොරොවා | 01 |
| 66. | එම්සී 31061 | පොරොවා | 01 |
| 67. | - | කියත් | 01 |
| 68. | - | කියත් | 01 |

02-691

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ, 9 වැනි ඡේදයට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව දන්වමු.

සමාගමේ නම : අවෙනා (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 62625
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 48, 27 වැනි පටුමග (ඉනර් ෆ්ලවර් පාරෙන්) කොළඹ 03.

02-631

---

## ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීම

ගාල්ල දිස්ත්‍රික්කයේ, ගිංතොට, බෝපේ පාර, අංක 29 හි පදිංචි, විනීතා පෙරේරා වික්‍රමසිංහ වන මා විසින් වර්ෂ 1998 ක් වූ නොවැම්බර් මස 04 වන දින ලෙබනන් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙන් සහතික කරන ලද විදේශ ඇටෝර්නි බලපත්‍රයෙන් ගිංතොට, බෝපේ පාර, අංක 29 හි පදිංචි, හේවා මානගේ චන්දිම බන්දු ජයරත්නට දී ඇති බලතල මෙයින් අහෝසි කරන බව දන්වා සිටිමි.

තවද, මින් ඉදිරියට හේවා මානගේ චන්දිම බන්දු ජයරත්න යන අය විසින් පෙර කී ඇටෝර්නි බලපත්‍රය යටතේ කරනු ලබන සියළුම ක්‍රියාවන්වලට මා වග නොකියන බව සියළු දෙනාට මෙයින් දැනුම් දෙනු ලැබේ.

විනීතා පෙරේරා වික්‍රමසිංහ.

02-621

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී :

සමාගමේ නම : ස්ප්ලෙන්ඩිඩ් ක්‍රේයන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී 62660
සංස්ථාගත කළ දිනය : 2008 ජනවාරි 09
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 24/5, 3 වන පටුමග පිළිකා රෝහල පාර, මහරගම

02-595

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදයට අනුව, පහත සඳහන් සමාගම නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව දන්වමු :

සමාගමේ නම : අර්ත්වින්ග් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 62698
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 29, ඩීල් පෙදෙස A කොළඹ 03.
ලියාපදිංචි දිනය : 2008 ජනවාරි 14

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්,
ප්‍රයිවට් ලිමිටඩ්.

02-629

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව දන්වමි.

සමාගමේ නම : සීමාසහිත J P ඇන්ඩ් S හෝල්ඩිංග්ස් ලංකා (පුද්ගලික) සමාගම.
සමාගමේ අංකය : PV 62830
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 11/3A, ස්කොෆීල්ඩ් පෙදෙස, කොළඹ 04
සංස්ථාපිත දිනය : 2008 ජනවාරි 28 වැනි දින

සමාගම් ලේකම්වරු,
කෝර්පරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම.

02-630

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදයට අනුව, පහත සඳහන් සමාගම ලියාපදිංචි කිරීම පිළිබඳව දන්වමු.

සමාගමේ පැරණි නම : කපිල හෙවි ඉක්විප්මන්ට්ස් පීඑල්සී
සමාගමේ අංකය : PQ 80
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 18, සෙන්ට් මයිකල්ස් පාර, කොළඹ 03
සමාගමේ අළුත් නම : එම්. ටී. ඩී. වෝකර්ස් පීඑල්සී

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් ප්‍රයිවෙට් ලිමිටඩ්.

02-628

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ දිස්ත්‍රික්කයේ කටුනායක සමගි මාවතේ අංක 418/1 හි පදිංචි මල්මාල කන්කානම්ගේ ජෙනිටා සෙව්වන්දි පෙරේරා වන මා විසින්, ජූජාපිටිය, මාරතුගොඩ අංක 155 හි පදිංචි, වඩිගදෙහෙට්ටි මුදියන්සේලාගේ මහින්ද විජේසිංහ (611432186 V )යන අය වෙත, පවරා ඇති මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජේ. ඒ. වත්සලා කුමාරි හේරත් මිය විසින් ලියා සහතික කරන ලද අංක, 360 සහ වර්ෂ 2006 ජූලි මස 10 දින දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගුකරන බවත්/මින් මතු එකී ඇටර්නි බලපත්‍රය මත එකී මාගේ ඇටර්නි බලකාරයා විසින් අදින් පසු කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගනුදෙනුවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ඇම්. කේ. ජෙනීටා සෙව්වන්දි පෙරේරා.

2008 පෙබරවාරි මස 05 වැනි දින දී ය.

02-550

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ ප්‍රකාරව පහත සඳහන් සමාගම ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : හොරිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්.
ලියාපදිංචි අංකය : පී. වී. 62877
ලියාපදිංචි ලිපිනය : අංක 320 1/1, ගාලු පාර, කොළඹ 03.

ජෙසි ඇන්ඩ් කම්පනි,
සමාගම් ලේකම්වරු,
අංක 41, ජනාධිපති මාවත, කොළඹ 01.

02-547

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහරගම පමුණුව පාරේ 3 වෙනි පටුමගේ අංක 141/5 දරන ස්ථානයේ පදිංචි නන්දනී ශ්‍රියාලතා තිසේරා වි/පෙර සෝවිස් වන මා විසින් ටියුඩර් ඩයස් රණසිංහ ප්‍රසිද්ධ නොතාරිස් මහතා විසින් සහතික කරන ලද වර්ෂ 2007 ක් වූ මැයි මස 16 දිනැති අංක 2790 දරන ඇටර්නි බලපත්‍රය මගින් හෝමාගම ගොඩගම පාදුක්ක පාරේ පදිංචි දොන් ආබ්‍රහම් අල්විස් ජයසිංහ යන අයට පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කොට අහෝසිකර අවලංගු කරනු ලැබේ.

එකී ඇටර්නි බලකාර දොන් ආබ්‍රහම් අල්විස් ජයසිංහ යන අය විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වගකියනු නොලැබේ.

නන්දනී ශ්‍රියලතා තිසේරා,
වි/පෙර සෝවිස්.

වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 30 වැනි දින දීය.

02-566

---

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

බත්තරමුල්ලේ ජයන්තිපුර බෝධිරාජ මාවතේ අංක 10 දරන ස්ථානයේ පදිංචි රොශාන්ත ඇන්ටන් මහින්ද රණසිංහ වන මා විසින් අත්සන් කරන ලද එක්සත් රාජධානියේ ප්‍රසිද්ධ නොතාරිස් ඩෙනිස් ට්‍රොවෝර් ද විච් විසින් සහතික කරන ලද 2001 ජූලි මස 9 දිනැති ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙස කඳාන බාලසූරිය මාවතේ අංක 26 දරන ස්ථානයේ පදිංචි කුරුකුලසූරිය චන්ද්‍රා ජෝශප් ඩයස් පත් කිරීම 2008 ජනවාරි මස 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බවත් මින් ඉදිරියට එකී කුරුකුලසූරිය චන්ද්‍රා ජෝශප් ඩයස් විසින් මාගේ ඇටර්නි බලකරු ලෙස සිදුකරන සෑම සියලු ක්‍රියාවකටම මා වගකීමෙන් තොර බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා ශ්‍රී ලංකාවේ මහජනතාවට මෙයින් දන්වා සිටිනු ලැබේ.

රොශාන්ත ඇන්ටන් මහින්ද රණසිංහ.

2008 ජනවාරි මස 11 දින දී ය.

02-521

---

## 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9(1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : අරලිය එස්ටේට් (පෞද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී/වී 62849
සංස්ථාපනය කල දිනය : 2008.01.29
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : සී/ඕ. පන්නිල එස්ටේට් පිටුපස (ඔෆ්) මතුගම පාර, පන්නිල.

මොහාන් නාමල් විජේසිංහ,
සමාගමේ අධ්‍යක්ෂක.

02-481

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තියෙහි වධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ග්‍රීන්රේ කොස්මෙටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 62756, 2008 ජනවාරි 18.
ලියාපදිංචි ලිපිනය : 117/2**D**, ඩී මැස්නඩ් ග්‍රවුන්ඩ් කම්ප්ලෙක්ස් පාර, කඳාන

ලේකම්.

02-483

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

බත්තරමුල්ලේ ජයන්තිපුර බෝධිරාජ මාවතේ අංක 10 දරන ස්ථානයේ පදිංචි රොශාන්ත ඇන්ටන් මහින්ද රණසිංහ වන මා විසින් අත්සන් කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. තවනේසන් විසින් සහතික කරන ලද අංක 8573 හා 2003 ජනවාරි මස 10 දිනැති ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරුවන් ලෙස දෙහිවල ගල්වල පාරේ අංක 92 දරන ස්ථානයේ පදිංචි වින්ස්ටන් ඩොඩවෙල් ඇන්තනි රණසිංහ සහ කඳාන බාලසූරිය මාවතේ අංක 26 දරන ස්ථානයේ පදිංචි කුරුකුලසූරිය චන්ද්‍රා ජෝශප් ඩයස් පත් කිරීම 2008 ජනවාරි මස 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බවත් මින් ඉදිරියට එකී කුරුකුලසූරිය චන්ද්‍රා ජෝශප් ඩයස් හා/හෝ වින්ස්ටන් ඩොඩ්වෙල් ඇන්තනි විසින් මාගේ ඇටර්නි බලකරු ලෙස සිදුකරන සෑම සියලු ක්‍රියාවකටම මා වගකීමෙන් තොර බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා ශ්‍රී ලංකාවේ මහජනතාවට මෙයින් දන්වා සිටිනු ලැබේ.

රොශාන්ත ඇන්ටන් මහින්ද රණසිංහ.

2008 ජනවාරි මස 11 වැනි දින දී ය.

02-522

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 124, දික්හේනපුර, හොරණ හි පදිංචි බුද්ධික සචිත් වන්නිආරච්චි වන මම මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් අංක 124, දික්හේන්පුර, හොරණ හි පදිංචි සුමිත්‍රලාල් වන්නිආරච්චි යන අය පත් කරන ලද, අංක 3631 සහ 2006.07.31 වන දින මහින්ද තිස්ස අතුකෝරල ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කල ඇටර්නි බලපත්‍රය 2008.02.01 වන දින සිට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු දෙනාටම මෙයින් දැනුම් දෙන අතර, මාගේ ඇටර්නි බලකරු විසින් මින් ඉදිරියට ඇති කර ගන්නා ලද ගණුදෙනු සම්බන්ධයෙන් මින් ඉදිරියට මාගේ බැඳීමක් නොමැති බවද වැඩි දුරටත් දන්වා සිටිමි.

බුද්ධික සචිත් වන්නිආරච්චි.

02-523

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 දරන වගන්තිය ප්‍රකාරව හයිපර් ඇකඩමික් ට්‍රේනර්ස් (පුද්ගලික) සමාගම වර්ෂ 2008 ජනවාරි මස 16 වන දින සංස්ථාපනය කරන ලද බවට කරන ලබන දැනුම් දීමයි.

සමාගමේ නම : හයිපර් ඇකඩමික් ට්‍රේනර්ස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : **PV** 62727
ලිපිනය : මොන්ටනා, ජා ඇල පාර, ගම්පහ

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් ,

සමාගම් ලේකම්.

02-562

---

## විශේෂ ඇටෝර්නි බලය අවලංගු කිරීමයි

1. කඳාන නාගොඩ සිල්වා මාවත දීප්ති හි පදිංචි දැනට ඔමාන් අධිරාජ්‍යයේ සිබ් තැපල් සංකේතය III තැපැල් පෙට්ටිය 68 රෝයල් එස්ටේට් හි පදිංචි විදේශ ගමන් බලපත්‍ර අංක එම් 1916668 හිමි අච්චුමුණි අනුර මිලාන් ක්‍රිස්ටෝපර් ඩි සිල්වා ඕමාන් අධිරාජ්‍යයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දෙවන ලේකම් වන එස්. කරුණාරත්න මහතා ඉදිරිපිට 2006 ක් වූ පෙබරවාරි මස 27 වන දින සහතික කරන ලද හා කොළඹ 12 රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවහි ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ 325 බාණ්ඩයේ 83 පත් ඉරුවේ 4465 දින පොත් අංක යටතේ ලියාපදිංචි කරන ලද විදේශ ඇටෝර්නි බලපත්‍රය සහ

2. කඳාන නාගොඩ සිල්වා මාවත දීප්ති හි පදිංචි විදේශ ගමන් බලපත්‍ර අංක එම් 1916668 හිමි අච්චුමුණි අනුර මිලාන් ක්‍රිස්ටෝපර් ඩි සිල්වා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. ඉදිගහවෙල මෙනවිය විසින් සහතික කරන ලද අංක 75 සහ 2006 ක් වූ අප්‍රියෙල් මස 04 වන දින කොළඹ 12 රෙජිස්ටර් ජනරාල් දෙපාර්තමේන්තුවෙහි ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ 331 බාණ්ඩයේ 13 පත් ඉරුවේ 7606 දින පොත් අංක යටතේ ලියාපදිංචි කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් ඇටෝර්නි බලකාරිය ලෙස ක්‍රියා කිරීමට බලය ලබා දෙන ලද කඳාන නාගොඩ සිල්වා මාවත දීප්ති හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 615853143වී හිමි අච්චුමුණි රාජින් දීප්ති ඩි සිල්වා යන අය වෙත ලබා දෙනු ලැබූ ඉහත කී ඇටෝර්නි බලය මින් අවලංගු කර බල ශූන්‍ය කරනු ලැබූ බවටත් මින් ඉදිරියට ඇය විසින් මෙම ඇටෝර්නි බලය පදනම් කරගෙන කරනු ලබන කිසිදු කටයුත්තක් බලසහිත නොවන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා එහි මහජනතාවට මෙසේ දැනුම් දෙනු ලැබේ.

අච්චුමුණි අනුර මිලාන් ක්‍රිස්ටෝපර් ඩි සිල්වා.

2008 ජනවාරි මස 29 වැනි දින.

02-603

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. දේවසේනාපති ලියා සහතික කරන ලද 1963 මාර්තු මස 30 වන දින සහ 1964 ජුලි මස 13 වන දිනැති අංක 840 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ ඇටෝර්නි අධිපතීන් වන හජි සර් මොහමඩ් මාකන් මාකර් ගේ අන්තිම කැමති පත්‍රයක් සහිත බූදලයේ භාරකරුවන් සහ පොල්මක්කරුවන් වූ අහමඩ් හුසේන් මාකන් මාකර්, අලවි ඉබ්‍රහිම් මාකන් මාකර් සහ මොහමඩ් අජ්වඩ් මාකන් මාකර්, හජි අබ්දුල් වඩූඩ් මාකන් මාකර් යන අයගේ අන්තිම කැමති පත්‍රයක් සහිත බූදලයේ භාරකරුවන් සහ පොල්මක්කරුවන් වූ අහමඩ් හුසේන් මාකන් මාකර්, මොහමඩ් ආතා තාසීම් සහ මොහමඩ් මැකී මාකන් මාකර්, අහමඩ් හුසේන් මාකන් මාකර්, අමීනා තු සොහරියා මාකන් මාකර්, ෆාතිමා තුෆා තාසිම්, මොහමඩ් අජ්වඩ් මාකන් මාකර්, සිත්ති කතිජා මාකන් මාකර්, නූරුල් කරීමා මොහමඩ්, ෆාතිමා ෂොයිබා ස්මයිල්, නූරුල් අමීනා මාකන් මාකර්, අහමඩ් හුසේන් මාකන් මාකර් සහ අහමඩ් මොහමඩ් අබූබකර්, මොහමඩ් අලි සම්සිදීන් මාකන් මාකර්, අහමඩ් හිල්මි මාකන් මාකර්, මොහමඩ් මෙකී මාකන් මාකර්, නූරුල් නුෆුස් මාකන් මාකරි සිත්ති සොහාරා මාකන් මාකර්, සිත්ති නූෂා මාකන් මාකර්, මොහමඩ් ඉස්මුත් මාකන් මාකර්, අහමඩ් හුසේන් මාකන් මාකර් මොහමඩ් අලම් මාකන්

මාකර්, මොහමඩ් මාකන් මාකර්, සිත්ති ෆෝකියා කාඩර්, සිත්ති අබ්බාසියා මාකන් මාකර්, හලිමුතු සයිදියා කාඩර්, සිත්ති සෙයිනා හසීම් යන අයගේ උරුමක්කාර, පොල්මක්කාර, අද්මිනිස්ත්‍රාසිකාර සහ ලැබුම්කරුවන් වන සියලු දෙනාම කොළඹ 07, ධර්මපාල මාවත, අංක 147/1 දරන ස්ථානයේ පදිංචි නූරුල් ෆර්දවුස් රෝහිනා උස්මාන්, නූර් නයිමා ඔලිවර් සහ මොහොමඩ් රිසා මාකන් මාකර්, දෙදෙනාම කොළඹ 03, ඇල්ෆ්‍රඩ් පෙදෙස, අංක 07 දරන ස්ථානයේ පදිංචි රිනෝසා සහබ්දීන් සහ ජෙනතුල් නූර් හමීදා මාකන් මාකර්, දෙදෙනාම කොළඹ 07, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, අංක 37/3 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් සැකී ඩින් මාකන් මාකර් සහ සමීරා මාකන් මාකර් කොළඹ 07, වොඩ් පෙදෙසේ, අංක 51/1ඒ දරන ස්ථානයේ පදිංචි හලිමුතු සයිදියා කාඩර් සහ පාතුමා මුනීෆා අයිඩෲස් යනුවෙන් ද හැඳින්වෙන පාතුමා මුනීෆා කාදර්, කොළඹ 03, ස්තාම්බුල් පෙදෙස, අංක 07 දරන ස්ථානයේ පදිංචි ෆාතිමා කෙසීමා විල්කාසිම් යනුවෙන් ද හඳුන්වනු ලබන ෆාතිමා කෙසීමා කොළඹ 07, ස්තාම්බුල් පෙදෙසේ, අංක 07 දරන ස්ථානයේ පදිංචි අයේෂා බෙතුන් ෆර්දවුස් නයින මරික්කාර් දැනට එංගලන්තයේ 113 පී. ආර්. ලන්ඩන් ෆ්‍රේරේන් බානට් හැම්ටන් ක්ලෝස් හි අංක 20 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් ඊබ්‍රහිම් සැලී ආෂික් මාකන්, එක්සත් රාජධානියේ ඩබ්ලිව්. ඩී. 173 ඊඊ වෝෆෝර්ඩ් ලැන්ග්ලිවේ, අංක 106 දරන ස්ථානයේ පදිංචි නූර් රස්නා තිර්මිසි මුසීන්, කොළඹ 03,06 වන පටුමගේ අංක 09 හි පදිංචි සිත්ති සහීමා මොහොමදියා මොහොමඩ්, කොළඹ 03, ගෝල්ෆේස් කොට් 2, අංක 49 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් යූස්රි මාකන් මාකර්, කොළඹ 07 ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, අංක 31 දරන ස්ථානයේ පදිංචි නූරුල් නයිමා ෂිහාමා කෆූර්, නාවල, නාරාහේන්පිට මාවතේ, වෝල්ටර් ගුණසේකර මාවත, අංක 46/15ඒ දරන ස්ථානයේ පදිංචි ෆාතුමා අයේෂා ඉමාම් (විවාහයට පෙර මාකන් මාකර්) කොළඹ 07, රොස්මිඩ් පෙදෙස, රොස්මිඩ් ටවර්ස්, අංක 102/1 4/1 දරන ස්ථානයේ පදිංචි නූරුල් ෆයිසිනා මාකර් (විවාහයට පෙර ඉස්මයිල්) කොළඹ 07, ධර්මපාල මාවත, අංක 157 5/1 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් මාකන් ඉස්මයිල්, කොළඹ 07, මල් පාර, අංක 61, ෆ්ලවර් කෝට්, මහල් අංක 301, ෆාතුමා ලයිකා සම්සුදීන්, අලි යනුවෙන් ද හැඳින්වෙන ෆාතුමා ලයිකා කොළඹ 02, උද්‍යාන වීදියේ අංක 74 හි පදිංචි අහමඩ් බිලාල් මොහොමඩ්, සියලු දෙනාම කොළඹ 03, ගෝල්ෆේස් කෝට්, අංක 44 දරන ස්ථානයේ පදිංචි නප්වා ෆස්නා මාකන් මාකර්, මොහොමඩ් මොහොදීන් සම්සුදීන් මාකන් මාකර්, මොහොමඩ් මොහිදීන් මසූඩ් මාකන් මාකර් සහ බසීර් අහමඩ් මොහොදීන් රිසා මාකන් මාකර්, කොළඹ 07, ධර්මපාල මාවතේ, අංක 145 දරන ස්ථානයේ පදිංචි සිත්ති අමිනා අවාතිෆ් මාකන් මාකර්, කොළඹ 07, ධර්මපාල මාවත, අංක 137 දරන ස්ථානයේ පදිංචි හරීසා සහීඩ්, කොළඹ 07, ධර්මපාල මාවත, අංක 137/1 දරන ස්ථානයේ පදිංචි ලෝලු සලීම්, කොළඹ 03, අබ්දුල් ගෆූර් මාවත, අංක 33 දරන ස්ථානයේ පදිංචි දැන් සිත්ති සොහරියා ඔස්මාන් යනුවෙන් හැඳින්වෙන සිත්ති සොහරියා මාකන් මාකර්, ඇමෙරිකා එක්සත් ජනපදයේ ස්ටෙෆානි ඇවනිව්, සෙරිටෝස් සීඒ 90703 දරන ස්ථානයේ අංක 19219 හි පදිංචි ෆාතිමා සහරියා ශෙරිෆ් විවාහයට පෙර මාකන් මාකර් කොළඹ 03 ගෝල්ෆේස් කෝට් 02 අංක 37 දරන ස්ථානයේ පදිංචි ෆාතුමා යස්මින් හසීම් කොළඹ 05, ඇන්ඩර්සන් පාර, අංක 11/2 දරන ස්ථානයේ පදිංචි අබ්දුල්ලා මැකී හසීම්, කොළඹ 07, ධර්මපාල මාවත අංක 143 දරන ස්ථානයේ පදිංචි මොහමඩ් මොහිදීන් තාහීර් මාකන් මාකර් වන අපි ඉහත කී ඇටෝර්නි අධිපතීන් විසින් පිළිවෙලින් එන්. එච්. මාකන් මාකර් සහ ඒ. ඩබ්ලිව්. එම්. රෆායි සහ එරික් ද සිල්වා තේනුවර සහ එල්. එල්. ප්‍රනාන්දු යන සාක්ෂිකරුවන් ඉදිරිපිටදී එකී අංක 840 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් ඇටෝර්නි බලකරු ලෙසට පත් කර ඇති ඕ. එල්. එම්. මාකන් මාකර් පුද්ගලික සමාගමට මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපල සම්බන්ධව අපට ඇති අයිතිවාසිකම්, උරුමකම් සහ බල පුළුවන්කාරකම් සම්බන්ධව ලබා දී ඇති විශේෂ ඇටෝර්නි බලය මෙහි දින සිට අවලංගු වී අහෝසි වී බලරහිත වන අතර බල පැවැත්මක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී රජයටත්, අනෙකුත් සියලු දෙනාටත් දන්වා සිටිමු.

තවද, එකී අංක 840 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් එකී ඇටෝර්නි බලකරුට අනෙකුත් ඉඩම් පරිශ්‍රයන් සම්බන්ධව ලබා දී ඇති අටෝර්නි බලය තවදුරටත් බලපැවැත්වේ.

### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොල්ලුපිටිය වෝඩ් අංක 17 හි පිහිටි කොල්ලුපිටිය පාර, වරිපනම් අංක 35, 41 සහ 47 ගෝල්ෆේස් ටෙරස් හි වරිපනම් අංක 3/1, 3/2, 3 1/1 සිට 3 1 1/4, 3 2/1 සිට 3 2/4, 3 1/1 සිට 3 3/4 දරන ගෝල්ෆේස් කෝට් නමැති ඉඩම බලයලත් මිනින්දෝරු කේ. එම්. සමරසිංහ විසින් සාදන ලද 1973 සැප්තැම්බර්, ඔක්තෝබර් සහ දෙසැම්බර් මස 08 වන දිනැති අංක 1811 ඒ දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1බී 1 (මෙය බලයලත් මිනින්දෝරු ආර්. එච්. ද සිල්වා විසින් මැන සාදන ලද 1963 මාර්තු මස 18 දිනැති 135ඒ දරන පිඹුර ප්‍රකාර කැබලි අංක ඒ ට සමාන වූ බලයලත් මිනින්දෝරු ආර්. එස්. ද සිල්වා මැන සාදන ලද 1963 මාර්තු මස 18 දිනැති අංක 149 දරන පිඹුරෙහි කැබලි අංක 1 හි කොටසක් නැවත මැන සාදන ලද කොටසකි) ට මායිම් උතුරට : මෙම ඉඩමේ කැබලි අංක 1ඒ, නැගෙනහිරට : ගෝල්ෆේස් ටෙරස් හි පිළිවෙලින් වරිපනම් අංක 47 සහ 43 දරන මෙම ඉඩමේ කැබලි අංක 2 සහ 20, දකුණට : කැබලි අංක 1බී2 සහ බස්නාහිරට : කොල්ලුපිටිය පාර යන මායිම් තුළ පිහිටි වපසරිය රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) වූ ඉඩම් පරිශ්‍රය.

02-567

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සෙලාන් බැන්ක් පීඑල්සී - (මරදාන ශාඛාව)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විකිණීමයි

වත්තල, බලගල පාරේ, වරිපනම් අංක 100/3 දරන පරිශ්‍රය බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ, හැඳල, මත්තේගොඩ පිහිටි, වත්තල, බලගල පාරේ වරිපනම් අංක 100/10 දරන "කැකුණගහ කුරුඳුවත්ත" නමැති ඉඩමෙන් (බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1986 මැයි 18 දාතම හා අංක 2453 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 හි ප්‍රති මිනුමක් වන) බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1996 නොවැම්බර් 1 දාතම හා අංක 112 දරන පිඹුරේ නිරූපිත (ඒකක 4 ලෙස ලකුණු කළ සහාධිපත්‍ය ඒකකය හැර) බෙදා වෙන්කොට සීමා නිර්නය කළ බිම් කොටස එහි පස ගහකොළ වගාවන් සහ අනෙකුත් සියලුම දේ සමග.

(ප්‍රමාණයෙන් අක් 0, රූඩ්. 0, පර්. 9.90ක ඉඩම) අංක 2453 දරන පිඹුරේ ලොට් 6 වශයෙන් ලකුණු කොට දක්වා ඇති (පාරට වෙන්කළ කොටස) බිම් කොටස මතින්, යටින් හා ඔස්සේ මාර්ග අයිතියද සමගය.

සෙලාන් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලය පරිදි ඉහත සඳහන් කළ දේපළ මා විසින් 2008 මාර්තු 10 වැනිදා සඳුදා පෙ. ව. 10.30ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

කොළඹ 13, යේමා එක්ස්පෝට් ඇන්ඩ් ට්‍රේඩ් යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ හවුලේ ව්‍යාපාරික කටයුතු කරගෙන යන, කේමමනී සේසලා, ඇනාමේරී සේසලා, කිංග්ස්ලි සේසලා, අප්පුතුරේල් මහාලිංගම් හා මංගගටිකරාසි මහාලිංගම් යන අය "බන්ධනදායීන්" වශයෙන්, ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් ලියා සහතික කළ 1997 අගෝස්තු 27 දාතම හා අංක 64 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. එල්. එච්. එච්. සිල්වා විසින් ලියා සහතික කළ 1998 අප්‍රේල් 9 දාතම හා අංක 948 දරන බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයිනි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007 ඔක්තෝබර් 26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2007 සැප්තැම්බර් මස 29 වැනි දින 'ඩේලිමිරර්' හා 'ලංකාදීප' පුවත්පත්ද, 2007 නොවැම්බර් 9 වැනි දින 'වීරකේසරී' පුවත්පත ද සහ විකුණුම් නිවේදනය සඳහා 2008.02.22 වැනි දින රජයේ *ගැසට්* පත්‍රයද බලන්න.

ගෙවන පිළිවෙල.-

1. මිල තීන්දු වූ වහාම ගැනුම් මිළෙන් 10% ක්
2. ගැනුම් මිළෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට කාර්යාලීය දින 30ක් ඇතුළත
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු දේශීය අලෙවි බද්ද 1% (සියයට එකයි)
4. විකුණුම් මිළෙන් (සියයට දෙකහමාරක්) 2 1/2%ක් වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල
5. රු. 41,690.65 නොඉක්මවන ප්‍රචාරක වියදමින් 50%ක්
6. ලිපිකරු හා නිවේදක ගාස්තුව රු. 500
7. විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපිලේඛන කොළඹ 3, ගාලු පාරේ අංක 90 හි සෙලින්කෝ සෙලාන් ටවර්ස්හි, 12 වැනි මහලේ, සෙලාන් බැන්ක්, පීඑල්සී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති දෙපාර්තමේන්තුව) වෙතින් ලබාගෙන පරීක්ෂාකර බැලිය හැකිය. දුරකථන : 4701000, 2456789.

ඩන්ස්ටන් කෙලාව්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්, රජයේ
සහතිකලත් විශේෂඥ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා දේපළ නියෝජිත.

42, දුටුගැමුණු වීදිය, පාමංකඩ, දෙහිවල
දුරකථනය : 2814743
දුරකථනය/ෆැක්ස් : 2814742, 2814744
ක්ෂණික ඇමතුම් : 0772250422

02-660

## නිවැරදි කිරීමයි

2008.02.08 වැනි දින පලවූ වෙන්දේසියේ විකිණීමේ *ගැසට්* නිවේදනය පහත සඳහන් පරිදි නිවැරදි විය යුතුය.

**සෙලාන් බැංකුව පීඑල්සී - සොයිසාපුර ශාඛාව**

මෙම දේපළ මොරටුව පදිංචි සුබසිංහ දොන් අශෝක සිසිර කුමාර ජයවර්ධන යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පී.එල්සී.වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

02-670

---

## පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වන වගන්තිය යටතේ වටිනා දේපලක් විකිණීම

බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයෙහි, කොළඹ මහ නගර සභා සීමාවට අයත්, කොළඹ 04, බම්බලපිටිය, ගාලුපාර, අංක 31 යන ස්ථානයේ පිහිටි, බලයලත් මිනින්දෝරු ජී. පී. අබේනායක මහතා විසින් සකසන ලද, 1999.04.21 දාතමින් යුතු, පිඹුරුපත් අංක 2749 හි ලොට් අංක 4ඒ දක්වන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 0, රූඩ්. 0, පර්. 3.449 එහි පිහිටි ගොඩනැගිල්ල සහ සියල්ල සහිතව කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවතන්ත්‍රී මහතා විසින් සහතික කරන ලද, 2005 සැප්තැම්බර් මස 30 දිනැති, අංක 857 දරන උගස්කරය ප්‍රකාර, ඇපකරු ලෙස සීමාසහිත කේ. කේ. පාර්මා (පුද්ගලික) ආයතනයත්, උගස්කරු ලෙස (ඇපකාර ආයතනයේ අධ්‍යක්ෂකවරයෙක්) මොහොමඩ් කාමිල් කුතුබ්දීන් නැමැත්තා විසින් පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී (කලින් පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් හා පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ) ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2008 මාර්තු මස 11 වැනි දින (අඟහරුවාදා) පෙරවරු 11.00ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*- මිල තීන්දු වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ක්
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක විකුණුම් බදු
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2%
4. රු. 90,000 කට අඩුවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

තීරණය පිළිබඳ දැන්වීම් සඳහා කරුණාකර 2008 ජනවාරි මස 25 වන දින සිලෝන් ඩෙයිලි නිවුස්, ලක්බිම, ෂුඩර් ඔලි පුවත්පත් ද 2008 ජනවාරි මස 25 වන දින *රජයේ ගැසට් පත්‍රයද* බලන්න.

වැඩි විස්තර හා ඔප්පුව පිළිබඳ ලියකියවිලි, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, නීති අංශය, පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී, 450, ගාලුපාර, කොළඹ 03 යන ලිපිනයෙන් නැරඹීමට හා ලබා ගැනීමට හැකිය. දුරකථන අංක : 2565573, 2565565.

ෂොක්මන් සහ සමරවික්‍රම
(ISO 9001 : 2000 සහතිකය හා රජයේ අනුමැතිය
ලත්, ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ,
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ, උපදේශක
තක්සේරුකරුවෝ සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන : 081-2227593
දුරකථන/ෆැක්ස් : 081-2224371
ඊමේල් : **schokmankandy@sltnet.lk**

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 5.
දුරකථන : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් : 011-2588176
ඊමේල් : **schokman@sameral 1892. com**

02-604

---

## සෙලාන් බැංකුව පීඑල්සී - ඇඹිලිපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පලාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න කෝරළේ දියපොතගම් පත්තුවේ හිගර ගමේ පිහිටි මිනුම්පතිගේ අංක එස් 38916 දරන හිමිකම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පහළවැවහේන නමින් හඳුන්වනු ලබන බෙදා වෙන් කරන ලද කැබලි අංක 578 දරන ඉඩම් කොටස අක්කර තුනයි රූඩ් තුනයි පර්චස් තිස්පහ (අ. 3, රූ. 3, පර්. 35) ක් වන ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඊ. වීරරත්න විසින් සහතික කරන ලද 1982.03.30 දිනැති 1935 දරන ඔප්පුවේ සඳහන් එකී ඉඩමෙන් කොටසක් බලයලත් මිනින්දෝරු කේ. ජී. ධර්මරත්න විසින් වලංගු කරන ලද 1998.04.25 දිනැති අංක 1151 දරන සැලැස්මෙන් පසුව මැන පෙන්වා ඇති අතර එකී කොටස රූඩ් දෙකයි පර්චස් පහලොවයි දශම පහයි හයක් (අ.0, රූ. 2, පර්. 15.56) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. (මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය සහ පත්ඉරුව ජී 46/122, ජී. 80/123, ජී 175/144 යටතේ ලියාපදිංචි කර ඇත)

මෙම දේපල තුංකව පදිංචි පොහොන්වැව දූරගේ පියදාස යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2008 මාර්තු මස 18 වන දින පස්වරු 1.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම* :- ඇඹිලිපිටියේ සිට නෝනගම පාරේ කි. මී. 9 ක් පමණ ගියවිට හමුවන කුට්ටිගල හංදියෙන් දකුණට ඇති උළු කර්මාන්ත ශාලාව පාරේ කි. මී. 3 ක් ගිය විට හමුවන කුඩා පාලම ලඟින් දකුණට ඇති බොරළු පාරේ (මෙම පාර මාමඩල ඇලට සමාන්තරව ඇත) කි. මී. 1.5 ක් ගිය විට අදාල දේපලට පිවිසිය හැක.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2006.12.29 වන දින පළ වී ඇත. ඩේලිමිරර් සහ ලංකාදීප පුවත්පත්වල 2007.02.02 දින ද වීරකේසරී පුවත්පතේ 2007.02.09 වන දින ද පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසි අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්), 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පී. එල්. සී. වෙත ගෙවා නිමකල යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ජේෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යධිකාරී (නීති) සෙලාන් බැංකුව පී. එල්. සී. අංක 90, ගාලු පාර, කොළඹ 03, දු. ක. 2456285, 2456263, 2456284

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දු. ක. 011-2696155, 011 - 2572940

02-669

---

## මහජන බැංකුව - (ගම්පොල ශාඛාව)

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත, ගඟ පහල කෝරළේ, ගම්පල නගර සභා සීමාව තුල ගම්පොළ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එම්. අබේරත්න මහතා විසින් මැන සාදන ලද අංක 1891 සහ 1999.10.30 දින දරන පිඹුරේ අංක 6 දරන බිම් කැබැල්ල වශයෙන් සලකුණු කොට ඇති පර්චස් අටයි දශම එකයි හයක් (අක්. 0, රූ. 0, පර්. 8.16) විශාල ඉඩම

සහ එහි පිහිටි තෙමහල් ව්‍යාපාරික ගොඩනැගිල්ල මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය මත අප විසින් 2008.04.04 වන දින පෙ.ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා රජයේ *ගැසට් පත්‍රයේ* 2003.02.14 වන දිනද, තිනකරන්/ඩේලි නිවුස් සහ දිනමිණ යන පුවත්පත්වල 2003.02.05 වන දින ද, පලකර ඇති දේපල වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.-* ගම්පොල සිට මහනුවර මාර්ගයේ, ගම්පොල කහටපිටිය දුම්රිය හරස් මාර්ගය ඉදිරිපස පාරට දකුණු පසින් ඉහත දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්
2. පළාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1% ක්
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත මහජන බැංකුව මහනුවර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 081-2234283
ෆැක්ස් අංකය : 081-2223017

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකිය. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම
රජයේ අනුමත **ISO** 9001 : 2000 සහතිකය ලත්
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ/තක්සේරුකරුවෝ සහ
දේපල ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය,*
අංක 24,ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය
081-2224371/081-2227593
ෆැක්ස් : 081-2224371

*නව නාගරික කාර්යාලය සහ ප්‍රදර්ශන ශාලාව,*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
011-2585408/011-2502680
ෆැක්ස් : 011-2588176
ඊමේල් : **schokman@samera 1892.com**.

02-664

## රුහුණ සංවර්ධන බැංකුව - ගන්දර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2008.03.12 දින පෙ.ව. 10.30ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දෙවිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ දෙවිනුවර පිහිටි, වරිපනම් අංක 224 දරන ගුරුවේ පදිංචිව සිටිය වත්ත නැමති ඉඩම, බලයලත් මිනින්දෝරු ඩබ්. පී. සුනිල් මහතා විසින් මැන සාදන ලද 1998.03.28 දිනැති අංක 91 දරන සැළැස්මේ කැබැලි අංක 01 ලෙස දක්වා ඇති පර්චස් විසිහයයි දශම හයයි නවයක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 26.69) ක් විශාල ඉඩමක්, එහි තුළ පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

වැඩි විස්තර සඳහා 2007.06.08 දින රජයේ *ගැසට් පත්‍රය ද*, 2007.12.07 දින දිනමිණ, තිනකරන් හා දි අයිලන්ඩ් යන පුවත්පත්වලද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.-* දෙවිනුවර ඔරලෝසු කණුව අසළින් වැටී ඇති ලයිට් හවුස් පාරේ මීටර් 300 ක් පමණ ගිය විට පාරේ වම්පස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදලද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවත, අංක 382ඒ, දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සභාපතිතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක 041-2231532, 2226208, 2226209, 2259585

පී. පී. ආනන්ද,
සාමවිනිසුරු බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත, වල්ගම, මාතර.
දුරකථන අංකය 041-2228731

02-511

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.